# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## රේගු (සංශෝධන)

**(235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින් 2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[218 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 007064—1,000 (2013/03)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රේගු ආඥා පනතේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ 10 වන වගන්තිය යටතේ රේගු බදු පැනවීම සම්බන්ධයෙන් බදු අභියාචනා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවනු ලැබූ බදු අභියාචනා කොමිෂම වෙත අභියාචනයක් කිරීමට අවස්ථාව සැලසීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ මත, ත්‍යාග අරමුදල රේගු සේවයේ නියුතු නිලධාරීන් හා සේවකයන් සහ තොරතුරු සපයන්නන් අතර බෙදාහැරීම සඳහා සහ රේගුවේ සේවා ධාරිතාව ඉහළ නැංවීම සඳහා වන ක්‍රියාකාරකම් සඳහා යොදාගැනීම වේ.

එල්. ඩී.—ඕ. 24/2013.

**(235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2013 අංක      දරන රේගු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:—

(235 වන අධිකාරයවූ) 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වන වගන්තියේ (1) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1අ) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩයක් මත රේගු බදු පැනවීමට අදාළව හෝ එකී භාණ්ඩ රේගු බද්දෙන් නිදහස් කිරීමට අදාළව හෝ එකී භාණ්ඩ මත හෝ භාණ්ඩ පිළිබඳ පැහැදිළි කිරීම් හෝ විස්තර මත රේගු බදු ගෙවීම හා සම්බන්ධ කොන්දේසියකට හෝ ව්‍යාතිරේකයකට අදාළව යම් ආරවුලක් ඇති වන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි එම භාණ්ඩවල ආනයනකරු විසින් හෝ අපනයනකරු විසින් වහාම තීරණය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාවෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(1ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ඉල්ලීම ලැබුණු දින සිට දින අනූවක් ඇතුළත (1අ) වගන්තිය යටතේ තමා වෙත යොමු කරන ලද ආරවුල පිළිබඳ තීරණය කළ යුතුය.

(1ඇ) (අ) අවස්ථාවෝචිත පරිදි ආනයනකරු හෝ අපනයනකරු වෙත (1අ) වගන්තියේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව ඇතුළත තීරණය දැනුම් දීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා අපොහොසත් වන අවස්ථාවක; හෝ

(ආ) එවැනි තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්—

2—PL 007031—475 (2013/02)

අවස්ථාවෝචිත පරිදි 1 (අ) උප වගන්තියේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව අවසන් වීමේ දින සිට හෝ එකී තීරණය ලැබීමේ දින සිට දින තිහක් ඇතුළත 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ බදු අභියාචනා කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකිය.”

ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තියේ (2) උප වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(ආ)(i) රේගු සේවයේ නියුතු නිලධරයන් හා සේවකයන් අතර සහ තොරතුරු සපයන්නන් වෙත බෙදා හැරීම සඳහා අමාත්‍යවරයා විසින් නිකුත් කොට ඇති මාර්ගෝපදේශවලට අනුකූලව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පරිපාලනය යටතේ ඇති ත්‍යාග අරමුදලට සහ රේගුවේ සේවා ධාරිතාව වර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරකම් සඳහා අනෙක් පංගුව.

(ii) (i) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් වන, සේවා ධාරිතාව වර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද කොටසෙන් ශේෂව ඇති සෑම අතිරික්ත වටිනාකමක්ම, සෑම මුදල් වර්ෂයක් අවසානයේ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(iii) මේ ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද සෑම මාර්ගෝපදේශයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.”

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.